රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/97

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997.09.08 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ අඩංගු ඇතැම්**
**කරුණු පිළිබඳ පැහැදිලි කිරීම.**

1994 ජූලි මස 25 වන දින නිකුත් කරන අංක: 27/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි එතෙක් පැවැති මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ නිලධාරීන් 1994 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන අයුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන ලදී. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා වූ ව්‍යවස්ථා සංග්‍රහය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 915/18 හා 1996.30.22 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර, එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේදී අදාළ පරිදි පහත සඳහන් ක්‍රියා මාර්ග ගතයුතු බැව් මෙයින් අවධාරණය කෙරේ.

02. එක් එක් පන්තියේ තනතුරු සංඛ්‍යාව
ව්‍යවස්ථාවේ 5.0 වගන්තිය අනුව 11 පන්තියේ "අ" ශ්‍රේණියේ සිට 1 පන්තිය දක්වා සේවක සංඛ්‍යා අනුපාතයක් නොතිබිය යුතු අතර, දෙපාර්තමේන්තුවට අදාළ මුළු තනතුරු සංඛ්‍යාව නොඉක්මවන සේ ඒ ඒ ශ්‍රේණිවල සේවක සංඛ්‍යාව අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය විසින් තීරණය කළ යුතුවේ. විශේෂ පන්තියේ පැවතිය යුතු තනතුරු සංඛ්‍යාව ව්‍යවස්ථාවේ 5:1 ඡේදය ප්‍රකාර තාක්ෂණ සේවා මංඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතුය. මෙසේ තීරණය කෙරෙන සියලුම තනතුරු සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය.

03. බඳවා ගැනීම්:-
තාක්ෂණ සේවාවට බඳවා ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් පැහැදිලි කිරීම් කරනු ලැබේ

3:1 තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 7:0 ඡේදයේ ඇති "ඒ අනුව අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් බඳවා ගැනීම් කළයුතුය." යන්නත් 6:2 ඡේදයේ "සියලු බඳවා ගැනීම් තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ". යන්නත් කෙරේ අවධානය යොමු කරනු ලැබේ. ඒඅනුව තාක්ෂණ සේවයේ සියලු බඳවා ගැනීම් දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශයේ අවශ්‍යතාව පරිදි අදාළ පත්වීම් බලධරයා විසින් කළ යුතුය.

04. බඳවා ගැනීම් පරිපාටි :-
ව්‍යවස්ථාවේ 7:0 ඡේදයේ සඳහන් අයුරින් අදාළ බඳවා ගැනීමේ පරිපාටි සඳහා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ඇතුලත් කරමින් ඒ සඳහා ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගැනීමට නොවලහා ක්‍රියා කළ යුතුය. මෙහිදී ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 2:9 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළයුතු අතර, ආයතන සංග්‍රහයේ පළමුවන කාණ්ඩයේ 2 පරිශිෂ්ඨයේ සඳහන් ආකෘතිය අනුව, අදාළ පරිපාටි සකස් කළ යුතුය.

05. වැටුප් පරිමාණයන්:-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 න් අනුමත වැටුප් පරිමාණයන් පැරණි පත්වීම්වලට අදාළව වැටුප් පරිවර්තනයේදී ද, 1997.01.01 දිනෙන් පසුව කෙරෙන පත්වීම් සඳහා ද අදාළ කරගත යුතුය.

06. **දෙපාර්තමේන්තු පරීක්ෂන සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ:**

6:1 ව්‍යවස්ථාවේ 9:0 ඡේදය කෙරෙහි ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කෙරෙන අතර, දෙපාර්තමේන්තු පරීක්ෂණ සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ යනු එකක් නොව වෙන වෙනම පැවැත්විය යුතු විභාග දෙකක් බැව් මෙයින් අවධාරණය කෙරේ. දෙපාර්තමේන්තු පරීක්ෂණ යනු ශ්‍රේණිගත උසස්වීම් සඳහා නිලධාරීන් සුදුසුකම් ලබන්නා වූ පරීක්ෂණ වන අතර, කාර්යක්ෂමතා කඩඉම් යනු යම් නිශ්චිත වැටුප් තලයන්ට එළඹීමට ප්‍රථම සමත් විය යුතු පරීක්ෂණ වේ.

6:2 ව්‍යවස්ථාවේ 9:0 ඡේදයේ 1 උප ඡේදය කෙරේ අවධානය යොමු කරන අතර, මෙම පරීක්ෂණ සඳහා පොදු විභාග, විභාගදෙපාර්තමේන්තුව විසින් පැවැත්වීම පිළිබඳව තීරණයක් ගන්නා තෙක් දැනට ඒ ඒ දෙපාර්තමේන්තු සහ ආයතනවලින් පවත්වනු ලබන විභාග ඒ අයුරින්ම දිගටම පැවැත්විය යුතුය. මේ දක්වා මෙම විභාග පවත්වා නොමැති ආයතනවල මෙ විභාග හැකි ඉක්මණින් පැවැත්වීමට පියවර ගත යුතුය.

07. **ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය:**

තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 3:0 (ආ) වගන්තිය කෙරේ අවධානය යොමු කෙරේ. තාක්ෂණ සේවාවේ කළමණාකරණයට අදාළ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ වගකීම ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලයට පැවරෙන අතර, එම මණ්ඩලය විසින් ගනු ලබන එබඳු තීරණ, චක්‍රලේඛ උපදෙස් වශයෙන් වරින් වර අදාළ ආයතනවල නිකුත් කිරීමට ක්‍රියා කෙරේ. සේවකයන් පුහුණු කිරීම හා සේවකයන් යෙදවීම පිළිබඳව ප්‍රතිපත්ති තීරණයක් ද තාක්ෂණ සේවා මණ්ඩලය විසින් ගනු ලබන අතර, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පුහුණු කිරීමත්,ඔවුන් අනුයුක්ත කිරීමත්, ස්ථාන මාරු කිරීමත්, පිළිබඳ පූර්ණ වගකීම් අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පැවරෙන බැව් ද මෙයින් අවධාරණය කෙරේ.

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරු ඉල්ලීම් ඇති අවස්ථා වෙතොත් එබඳු ඉල්ලීම් පමණක් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

08. **උස්සවීම්:-**

8:1 1994.07.01දින දක්වා ක්‍රියාත්මකව පැවති මධ්‍යම මට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථාව අනුව එවකට එම සේවාවේ සිටි ඇතැම් නිලධාරීන්ට හිමි විය යුතු උසස්වීම් ලබදී නොමැති නම්, එවකට බලපැවැත්වූ ව්‍යවස්ථාව අනුව යම් නිලධාරියෙකුට හිමි විය යුතුව තිබූ උසස්වීම් අදාළ අවම සුදුසුකම් සපුරාලීමෙන් පසුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. එහිදී ඒ ඒ සේවාවේ සම්පූර්ණ කළ යුතුව තිබූ අවම සේවා කාලයත් ඉහළ ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය වූ අවම විභාග අවශ්‍යතාවයක් සපුරා ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්විය යුතුය.

8:2 එසේ නියමිත උසස්වීම් ලබාදීමෙන් අනතුරුව 1994.07.01 දින වන විට අදාළ නිලධාරියාට හිමිවන්නා වූ පන්තිය / ශ්‍රේණිය සැලකිල්ලට ගෙන 1994.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක : 27/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූලව එම නිලධාරීන් ඊට ඉහළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පියවර ගත යුතුය. ඒ අනුව 1994.07.01 දින සිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ අදාළ ශ්‍රේණියට ඔහු පත් කෙරෙන ලිපියක් නිකුත් කළයුතු වේ.

8:3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ 1994.07.01 දින සිට යම් නිලධාරියකු පත් කරමින් නිකුත් කරන ලද පත්වීම් ලිපිය පදනම් කරගෙන, තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 8:0 හා 9:0 ඡේදවල සඳහන් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව උසස්වීම් 1994.07.01 න් පසුව ඔහුට/ඇයට ලබාදීමට ක්‍රියා කළයුතු වේ. මෙම උසස්වීම් ලබාදීමේදී ව්‍යවස්ථාවේ 4:0 ඡේදය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන අතර, බඳවාගැනීමේ ශ්‍රේණිය වන 11 (ආ)පන්තියේ සිට 1 පන්තිය දක්වා උසස්වීම් සේවක සංඛ්‍යා අනුපාතයක් නොමැතිව ක්‍රියාත්මක කළ යුතුය

8:4 ඉහත 8:1 වගන්තිය යටතේ කිසියම් නිලධාරියෙකුට උසස්වීමක් ලබාගෙන ලද අවස්ථාවක, එසේ උසස්වීම ලබාදෙන ලද දිනයේ සිට 1994.07.01 දින දක්වා මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ සිටි සේවා කාලයද, තාක්ෂණ සේවාවේ අදාළ ශ්‍රේණියේ සිටි සේවා කාලයක් ලෙස සලකා ක්‍රියා කළයුතුය. (තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 10:0 ඡේදයේ සඳහන් පරිදි)

8:5 ව්‍යවස්ථාවේ 8:1 ඡේදයේ (අ) වගන්තිය අනුව 11 "ආ" පන්තියේ වසර 6 ක සතුටුදායක සේවා කාලයක් සහිත පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් නිලධාරීන් 11 "අ" බණ්ඩයට උසස් කිරීමේදී ඔවුන් 1 කාර්යක්ෂමතා කඩඉම ද සමත්වීම අනිවාර්ය වේ.

8:6 ව්‍යවස්ථාවේ 8:1 ඡේදයේ "ආ" වගන්තිය අනුව 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත්ව වසර 12 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් 11"අ" පන්තියට උස්ස කිරීමේ දී ඔවුන් 1 වන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්වීම අනිවාර්ය නොවේ.

8:7 ව්‍යවස්ථාවේ 8:2 ඡේදයේ සඳහන් අයුරු 11"අ" බණ්ඩයේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සහ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්ව ඇති නිලධාරීන් 1 පන්තියට උසස් කිරීමේදී ඔවුන් 11"අ" බණ්ඩයට නියමිත 11 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබිය යුතුය.

09. <u>දෙපාර්තමේන්තුමය සේවාවන් තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම</u>

යම් දෙපාර්තමේන්තුමය සේවාවක් තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ආයතන ප්‍රධානීන් විසින් යෝජනා ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිය උපයෝගී කර ගත යුතුය. තවද සේවාවේ වර්තමාන ව්‍යුහය සහ ආයතනික සංවිධාන ව්‍යුහය දැක්වෙන ලේඛණයක් අදාළ සේවාවේ දැනට ක්‍රියාත්මක වන බඳවාගැනීමේ පරිපාටිය/ පරිපාටි සහ එම තනතුරේ/සේවාවේ නිලධාරීන්ගේ වර්තමාන රාජකාරි ලේඛණයේ පිටපතක්මෙම ආකෘති පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

තාක්ෂණ සේවාවට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කෙරෙන මෙබඳු ඉල්ලීම් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 1997.12.31 සින තෙක් කල්දෙන අතර, අලුතෙන් ඇති කෙරෙන තනතුරක් වර්ගීකරණය කිරීමක් හැරුණුවිට එදිනෙක් පසුව අන්තර්ග්‍රහණය සඳහා ලැබෙන ඉල්ලීම් මණ්ඩලය මගින් සලකා බලනු නොලැබේ.

10. මීට අතිරේකව ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී මතුවන්නා වූ යම්ගැටලුවක් හෝ ඒ පිලිබඳව පැහැදිලි කිරීමක් වෙතොත් එබඳු කරුණු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ නිලධාරීන් බඳවාගැනීමේ**
**හා උසස්කිරීමේ ඒකාබද්ධ පරිපාටිය යටතේ**
**<u>තනතුරු අන්තර්ග්‍රහණය කිරීම</u>**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය වෙත තනතුරු**
**අන්තර්ග්‍රහණය/නව තනතුරු වර්ගීකරණය**
**<u>සඳහා මුල්වරට කෙරෙන ඉල්ලීම</u>**

1. අමාත්‍යාංශය:-

2. දෙපාර්තමේන්තුව:-

3. තනතුරේ/සේවාවේ නම:-

4. තනතුර/සේවාව අනුමත කළ දිනය හෝ වර්ෂය :-

5. මෙම සේවාවේ අනුමක මුළු සේවක සංඛ්‍යාව හා එක් එක් ශ්‍රේණිවල අනුමත සංඛ්‍යාව:-

6. තනතුර/සේවාව අනුමත කළ භාණ්ඩාගාර ලිපියේ/ලිපිවල යොමුව:-
(අදාළ භාණ්ඩාගාර ලිපියේ/ලිපිවල පිටපත් අමුණනන්න.)
(වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් නොවන්නේ නම් පමණක්)

7. බඳවාගැනීමේ ශ්‍රේණිය:-

8. **<u>බඳවාගැනීමේ ශ්‍රේණියේ වැටුප් පරිමාණය:-</u>**

    8:1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/92 න් නිර්දේශිත වැටුප් ක්‍රමය:-

    8:2 ඉන්පසුව වැටුප් ප්‍රතිශෝධනක් කරන ලද්දේ නම් වැටුප් පරිමාණය හා අදාළ චක්‍රලේඛ අංකය:-

9. **<u>ඇතුළත්වීමේ සුදුසුකම්:-</u>**

    9:1 අධ්‍යාපන:-

    9:2 වෘත්තීය:-

10.. පුහුණුවීමේ කාලපරිච්ඡේදය:-

11. තනතුරට/සේවාවට අදළ රාජකාරි ලැයිස්තුව:-

12. තනතුරට/සේවාවට බඳවාගැනීමේ/උසස්කිරීමේ පරිපාටිය අනුමත කළ ආයතන අධ්‍යක්ෂගේ යොමුව :-
(අනුමත බඳවාගැනීමේ/උසස්කිරීමේ පරිපාටියේ පිටපතක් මෙයට යාකරන්න.)

13. 1977.05.01 දිනෙන් පසුව තනතුරට/සේවාවට අදාළ බඳවාගැනීම්/උසස් කිරමේ පරිපාටිය සංශෝධනය කරන ලද්දේද යන වග:-

තනතුරට / සේවාවට බඳවාගැනීමේ පරිපාටිය 1997.05.01 දිනහෝ ඊට පසුව සංශෝධනය කරන ලද්දේ නම් එම සංශෝධිත බඳවාගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ පිටපතක් සමග පහත සඳහන් තොරතුරු වාර්තා කරන්න.

13:1 බඳවාගැනීමේ/උසස් කිරීමේ පරිපාටිය සංශෝධනය කිරීමට තුඩුදුන් හේතූන් :-
13:2 සංශෝධනය කළ දිනය:-
13:3 සංශෝධනය අනුමත කළ ආයතන අධ්‍යක්ෂගේ ලිපියේ/ලිපිවල යොමු අංකය:-

14. තනතුරට / සේවාවට අදාළ දෙපාර්තමේන්තු විභාග හා/ හෝ කාර්යක්ෂමතා කඩඉම් විභාග පිළිබඳව විස්තර:-

15. දෙපාර්තමේන්තුවේ හෝ අදාළ අංශයේ සංවිධාන ව්‍යුහය දක්වෙන සටහන් හා එකී තනතුරට/සේවාවට එම සංවිධාන ව්‍යුහයේ හිමි ස්ථානය:-
(සංවිධාන සටහනක් මගින් පෙන්නුම් කරන්න.)

16. තනතුර/සේවාව උසුලන නිලධාරින් විවිධ ශ්‍රේණිවල නිලධාරින් විසින් අධීක්ෂණය කරනු ලබන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු:-

(එම කාර්ය මණ්ඩලයට අයත් වන්නවුන්ගේ තනතුරු හා ශ්‍රේණි අනුව විස්තර දක්වුව මැනවි)

17. මෙම තනතුරට / සේවාවට අ යත් කිසියම් තනතුරකට/සේවාවකට/ශ්‍රේණියකට උස්සවීම සඳහා හිමිකම් ලබදෙන මෙහෙයුම් තනතුරක්/සේවාවක් වන්නේ නම් ඒ පිළිබඳ විස්තර:-

18. මෙම තනතුරට / සේවාවට පත්වීම් සඳහා හිමිකම් ඇති මෙහෙයුම් තනතුරු/ශ්‍රේණි කිසිවක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර-:-

19. ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ තනතුරුවලට වඩා ඉහළ තනතුරුවලට හෝ සේවා වලට උසස්වීම් සඳහා දැනට පවත්නා අවස්ථාවන් පිළිබඳ විස්තර:-

20. මෙම සේවාවේම බඳවාගැනීමේ පන්තියට වඩා ඉහළ ශ්‍රේණි/පන්ති කිසිවක් තිබේද? එසේ නම් එම ශ්‍රේණිවල / පන්තිවල වැටුප් පරිමාණයන් හා අනුමත තනතුරු සංඛ්‍යාවද සවිස්තරව දක්වන්න.

21. මෙම තනතුර /සේවාව අන්තර්ග්‍රහණය කරවා ගැනීම අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ කුමන පන්තියකට/ශ්‍රේණියකටද යනවග:-

22. මෙම තනතුර/සේවාවට සමාන තනතුරු/සේවාවන් හා රාජකාරි ස්වභාවයක් ඇති දැනටමත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අන්තර්ග්‍රහණය කරන ලද රජයේ වෙනත් අමාත්‍යාංශවල/දෙපාර්තමේන්තුවල තනතුරු/සේවාවන් කිසිවක් තිබේනම් ඒ පිළිබඳ විස්තර:-

23. තනතුර/සේවාව ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අන්තර්ග්‍රහණය කරනු ලැබුවහොත්/ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව යටතේ වර්ගකරනු ලැබුවහොත් 11"ආ" පන්තියට බඳවාගැනීමට හැකියාව ඇත්ද යනවග:-

24. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ විෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරා දෙනු ලැබ ඇති නිලධාරියාගේ සහතිකය:-

මෙම ඉල්ලීම සම්බන්ධයෙන් අදාළ වන කරුණු මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූවෙමි. මෙම තනතුර/සේවාව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ 1:0 ඡේදයේ සඳහන් අර්ථ නිරූපනය හා සැසඳෙන බව මගේ ඒකාන්ත වැටහීමයි. මෙම තනතුර/සේවාව ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අන්තර්ග්‍රහණය කිරීම/ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව යටතේ වර්ග කිරීම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් සඳහා අත්‍යාවශ්‍ය බව සහතික කරමි.

අත්සන:-

නම:-

තනතුර:-

දිනය:-

25. අමාත්‍යාංශ ලේකම්ගේ හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ ක්‍රියාත්මක කිරීමේ විෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම අමාත්‍යාංශයේ ලේකම් විසින් පවරා දෙනු ලැබ ඇති නිලධාරියාගේ නිර්දේශය:-

මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම අංශයන්හි ඇති සමාන තනතුරුහා සේවාවන් සමඟ ඉහත දැක්වෙන තනතුර/සේවාව අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ මූලික ඉල්ලීම සලකා බලන ලද අතර, මෙහිලා බලපාන සියළුම කරුණු පිළිබඳව මනා අවබෝධයක් මවිසින් කරන ලදී. පහත දැක්වෙන හේතු මත මෙම ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

අත්සන:-

නම:-

තනතුර:-